# බිෂොප්ලා ජෙනරාල්ලා හා තානාපතිවරු

විජාතික රූපවාහිනිය තම නිව්ස් ස්ටේෂන් නමින් සෙනසුරාදාට ප්‍රචාරය කරන ප්‍රවෘත්ති ටෙලි නාටකයෙන් මන්නාරමේ රායප්පු ජෝසප් බිෂොප්වරයා හා යාපනයේ සෞන්දරනායගම් බිෂොප් වරයා, බ්‍රිගේඩියර් ජෙනරල් සරත් ෆොන්සේකා මහතා ආණ්ඩුවේ සාම ක්‍රියාදාමයට විරුද්ධව යන බව කියා ඇතැයි දෙබසක් මගින් කියා සිටියේය. මෙහි සභාපතිවරයා සිංහල අධ්‍යයනාංශයක මහාචාර්ය වරයකු යැයි කියැවෙයි. ඔහුට නිව්ස් ස්ටේෂන් සඳහා සුදුසු සිංහල වචන තෝරා ගැනීමට තරම් සිංහල ඉංගිරිසි දෙබසින් එක බසකින් හෝ දැනුමක් නොමැති වීම එයට හේතුව විය හැකි වුවත් මෙහිදී ඔහු ඉංගිරිසි වදන යොදා ගන්නා ලෙස උපදෙස් දී ඇත්තේ වෙනත් කරුණක් නිසා යැයි විජාතික රූපවාහිනී ආරංචි මාර්ගවලින් දැන ගැනීමට ලැබී ඇත. ඔහු එතැනට පත් කර ඇත්තේ ජාතිය සිතන ආකාරය වෙනස් කිරීමට යැයි පැවසෙයි. එහෙත් ප්‍රශ්නය වන්නේ හිතන්නට නොහැකි වුවන් ජාතිය හිතන ආකාරය වෙනස් කරන්නේ කෙසේද යන්නය. ඔහු ක්‍රියාත්මක කරන්නේ වෙනත් අයගේ අණය. නිදහස් චතුරශ්‍රය පැත්තේ පඳුරකට පයින් ගැසූ කල මෙවැනි මහාචාර්යවරුන් දුසිම් ගණනින් විසිවනු ඇත. කෙසේ වුවත් ඔහු ළඟදී ප්‍රචාරය වූ දේශීය නැඹුරුවක් ඇති ටෙලි නාට්‍යයක අධ්‍යක්ෂවරයාට කතා කර තවත් එවැනි ටෙලි නාට්‍ය නිර්මාණය නොකරන ලෙසට අවවාද කර ඇතැයි ප්‍රවෘත්ති අංශයෙන්ම වාර්තා වෙයි. මෙරට සාරධර්ම ද ඇතුළත් සංස්කෘතිය විනාශ කිරීමේ ව්‍යාපාරයක් මහාරාජා වරුන්ට අයත් ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා මගින් දැනට අවුරුදු පහළොවකට ආසන්න කාලයක් තිස්සේ ක්‍රියාත්මක වන බව රහසක් නොවේ. අද ජාතික රූපවාහිනිය ද මේ කාර්යයට අත ගසා ඇත.

බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය ක්‍රියාත්මක වන්නේ ආර්ථික හා දේශපාලන ස්ථරවල පමණක් නොවේ. එය සංස්කෘතික ක්ෂෙත්‍රයෙහි ද ක්‍රියාත්මක වෙයි. අවුරුදු පන්සියයක යටත් විජිතවාදයක් තුළ මෙරට සංස්කෘතිය වෙනස් කිරීමට බටහිරයන් තම පල්ලි, පාසල්, විශ්වවිද්‍යාල, රැකියා ආයතන, පසුව ජනමාධ්‍ය ආදී විවිධ ආයතන හරහා උත්සාහ ගත් නමුත් ඒ බොහෝ දුරට අසාර්ථක විය. අද ජනමාධ්‍ය හරහා මෙය ඉතා තීව්‍ර ව ක්‍රියාත්මක වෙයි. (කලින් සඳහන් කළ ගුවන් විදුලි නාලිකාව ආරම්භ කළ දිනවල ම අපි ඔවුන්ගේ අවශ්‍යතාව කුමක්දැයි පැහැදිලි කෙළෙමු.) යම් ජාතියක් බෙලහීන කළ හැක්කේ ඒ ජාතියෙහි විනය ද ඇතුළත් සංස්කෘතිය විනාශ කිරීමෙනි. අවුරුදු පන්සියයක් තිස්සේ ඉතා සුළුවෙන් පල දැරූ සංස්කෘතික ආක්‍රමණය අද මහා පරිමාණයෙන් පල දරමින් ඇත. සාම්ප්‍රදායික විනය සහිත සංස්කෘතිය විනාශ කරගත් ජාතියකට පැවැත්මක් නැත. මේ කරුණ බටහිරයෝ හොඳින් දනිති. අප වැනි රටවල ඇංකරයන් එල්ලකරගෙන සංස්කෘතියක් නැත. ජාතියක් නැත. ආදි වශයෙන් ප්‍රවාද බිහිකරන අතර බටහිරයෝ වෙනත් සංස්කෘතීන් නිසා වෙනත් ජාතීන් නැති කිරීමේ ව්‍යාපෘතියක් ගෙන යති. අර ඇංකරයෝ මහත් උජාරුවෙන් බටහිරයන්ගේ මතවාද පුනරුච්ඡාරණය කරමින් පොරවල් වීමට දඟලති. එසේ පොරවල් වීමට උත්සාහ කරන්නේ ජාතියට පොරෝ පහර ගසමිනි. පොර යනු ජාතියට පොරෝ පහර ගසන්නෙකි යනුවෙන් පොර යන පදය නිර්වචනය කළ හැකිය.

නිව්ස් ස්ටේෂන් නම් චරිත තුනේ ටෙලි නාට්‍යයෙන් කියැවෙන ආකාරයට බිෂොප්වරුන්ට අනුව ජෙනරාල්වරයා හමුදා අධි ආරක්ෂක කලාපයෙන් ඉවත් කර නොගැනීමට ආණ්ඩුව නමින් පවත්වාගෙන යන පරිපාලන මධ්‍යස්ථානයට වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් කර ඇත්තේ තදබල වරදකි. ඇතැම් දෙමළ ජාතිවාදීන්ට අනුව සරත් ෆොන්සේකා මහතා වහාම යාපනයෙන් මාරු කළ යුතුය. බිෂොප්වරුද එසේ කියන්නේ දැයි පැහැදිලි නැත. එහෙත් මේ බිෂොප්වරු දෙමළ ජාතිවාදීන් බව ද කොටි සංවිධානයේ හිතවතුන් බවද පසුගිය අවුරුදු කිහිපය තුළ ඔවුන් කටයුතු කර ඇති ආකාරයෙන් පැහැදිලි වෙයි. අද දෙමළ ජාතිවාදීන්ට සරත් ෆොන්සේකා මහතා වැනි හමුදා නිලධාරීන් විශාල ප්‍රශ්නයක් වී ඇත. මේ අවස්ථාවේ දී සියලු දේශප්‍රේමීන් බිෂොප්ලාට එරෙහිව ෆොන්සේකා මහතා වැනි නිලධාරීන් ආරක්ෂා කළ යුතුව ඇත.

කොටි ත්‍රස්තවාදීන්ට අවශ්‍ය වුයේ කරුණු විකෘති කර ජනතාව මුලා කිරීමය. ඔවුන්ට බටහිරයන් මුලා කිරීමට අවශ්‍ය නොවන්නේ බටහිරයන් ද ඔවුන් සමග එක්වී ජනතාව මුලා කරන බැවිනි. එහෙත් දෙමළ ජනතාව නොදන්නා හා තේරුම් නොගන්නා කරුණක් වෙයි. එනම් බටහිරයන් දෙමළ ජාතිවාදයට ආධාර කරන්නේ සිංහලත්වයට එරෙහිවීම සඳහා මිස හින්දු සංස්කෘතියට ඇති කරුණාවක් නිසා නොවන බවය. අපි එක් සරල උදාහරණයක් ගනිමු. මුත්තයියා

© Prof. Nalin De Silva

මුරලිදරන් දෙමළ හින්දු බව නොදන්නා සිංහලයෙක් නැත. එහෙත් කිසිම සිංහලයෙක් මුරලිදරන්ගේ දෙමළ හින්දුකම නිසා ඔහු ක්‍රිකට් කණ්ඩායමෙන් ඉවත් කළ යුතු යැයි නොකියයි. විස්ඩන් සඟරාවට අනුව මුරලිදරන් ලෝකයේ මෙතෙක් බිහි වී ඇති හොඳම ටෙස්ට් පන්දු යවන්නා ය. ඒ සඟරාව යම් ලකුණු ක්‍රමයකට එකඟ වූ පසු මුරලිදරන් ඒ ක්‍රමය අනුව ප්‍රමුඛස්ථානයට පත් වී ඇත. කිසිම සිංහලයකු මුරලිදරන්ට විරුද්ධ නොවන නමුත් ඇංග්ලො ක්‍රිස්තියානි රටවල සුද්දෝ ඔහුට විරුද්ධ වෙති. මොවුන්ගෙන් යම් පිරිසකට අවශ්‍ය වී ඇත්තේ මුරලිදරන් කණ්ඩායමෙන් ඉවත් කිරීමටය. ඔවුන් පන්දුව දමා ගැසීම ගැන කුමක් කීවත් මෙයට හේතුව මුරලිදරන් සුදු නොවීම ය. ඔහු ඇංග්ලො ක්‍රිස්තියානි රටක් වෙනුවෙන් ක්‍රීඩා නොකිරීමය. සිංහලත්වය දුර්වල කිරීමෙන් පසුව සුද්දන් මුරලිදරන්ට කරන දේ දෙමළ ජනයාට ද කරනු ඇත. ඔවුන් අද දෙමළ ජනයාට ආධාර කරන බවක් පෙනේ නම් එයට හේතුව ඔවුන්ට සිංහලත්වයට එරෙහිව දෙමළ ජාතිවාදය යොදා ගැනීමට ඇති අවශ්‍යතාවය ය.

මෙහි සිංහලත්වය ගැන ද වචනයක් කිව යුතුය. මහින්ද දීගල්ලේ හෙවත් දීගල්ලේ මහින්ද හිමි නමින් හැඳින්වෙන්නකු ද මැදිහත් වී එංගලන්තයේ බාත් නම් නගරයේ දී පවත්වන ලද සම්මන්ත්‍රණයක දී දෙමළ ජාතිවාදයේ න්‍යායාචාර්ය වරයකු වූද ස්විඩන් හි උප්සලා විශ්වවිද්‍යාලයෙහි තුලනාත්මක ආගම්පිළිබඳ මහාචාර්යවරයකු වූ ද පීටර් ෂාක් මහතා මා ජාතික චින්තනය සිංහලත්වය ලෙස හඳුන්වන බව කියා ඇත. සිංහලත්වය හා ජාතික චින්තනය යනු එකක් නොව දෙකක් බව මේ ලිපි කියවන බොහෝ දෙනා දනිති. එහෙත් ෂාක් මහාචාර්යවරයාට ඒ බවවත් අවබෝධ කර ගැනීමට නොහැකි වී ඇත. අපේ ප්‍රශ්න ගැන කතා කරන්නෝ සිංහලෙන් හෝ ඉංගිරිසියෙන් පළවන ලිපියක් කියවා තේරුම් ගත නොහැකි මෙවැනි ඊනියා විශාරදයෝ ය.

අප අතුරු කතාවලට යැමට පෙර සඳහන් කෙළේ බිෂොප්වරු හා ජෙනරල්වරු ගැන ය. සරත් ෆොන්සේකා මහතා ඇතුළු හමුදාවට පින් සිදු වන්නට අධි ආරක්ෂිත කලාපවලින් හමුදා ඉවත් කර ගැනීම තාවකාලිකව නැවතී ඇත. කොටි ත්‍රස්තවාදීහු තමන්ට සුපුරුදු ආකාරයට ප්‍රශ්නය අවුල් කළහ. කොටින් සතුව ඇති භයානක ම ආයුධ බෝම්බ හෝ තුවක්කු හෝ නොවේ. ඔවුන් ජයග්‍රහණ ලබන්නේ ප්‍රශ්න අවුල් කිරීමෙන් හා බොරු ප්‍රචාරවලිනි. අධි ආරක්ෂිත කලාපවලින් හමුදාව ඉවත් කිරීම අදාළ පෙදෙස්වල දෙමළ ජනයා පදිංචි කිරීම සමග සම්බන්ධ කිරීමට ඔවුහු උත්සාහ ගත්හ. අවබෝධතා ගිවිසුම යන නමින් හැඳින්වෙන පාවාදීමේ ගිවිසුමෙහි ඊනියා සටන් විරාමයක් ගැනද කියැවෙයි. මේ පාවා දීමේ ගිවිසුමේ අරමුණ අන් කිසිවක් නොව කොටින්ට සටන් කර දිනාගත නොහැකි වූ දේ ඊනියා සටන් විරාමය තුළ ඔවුන්ට ලබා දීමය. ඒ සඳහා බටහිරයන්ගේ මෙයෙවීමෙන් අතන මෙතන බොරු සාකච්ඡා පැවැත්වෙයි. කළ යුත්තේ කුමක්දැයි බටහිරයෝ සාකච්ඡාවට පෙරම දනිති.

කෙසේ වෙතත් ඊනියා සටන් විරාමයෙහි දී පිළිපැදිය යුතු ප්‍රධානම කරුණ වන්නේ බල තුළනය වෙනස් නොකර පවත්වා ගෙන යැමය. අධි ආරක්ෂිත කලාපවලින් හමුදාව ඉවත් වීම යනු හමුදාවේ බලය අඩු කිරීමකි. මේ ඊනියා සටන් විරාමයට පෙර ම හමුදාව විසින් මිලේනියම් සිටි සංකීර්ණයෙහි පවත්වා ගෙන ගිය විශේෂ ඒකකය විසුරුවා හැර කොටින්ට නව ජීවයක් ලබා දීමට ආණ්ඩුව නමින් ක්‍රියා කරන්නෝ පියවර ගත්හ. කොටින්ට අවශ්‍ය වන්නේ යාපනයෙන් හමුදාව ඉවත් කිරීමයි. එහෙත් ඔවුහු අවි අත්හැරීමට අකමැති වෙති. කොටියාට අවශ්‍ය කුමක්දැයි තේරුම් ගැනීමට උගේ වල්ගය අත ගෑ යුතු නොවේ. ඊනියා සටන් විරාමය තුළ හමුදාවට යාපනයෙන් ඉවත්වීමට කිව නොහැකි බව කොටි දනිති. එබැවින් ඔවුහු ප්‍රශ්නය අවුල් කර ඒ වෙනුවට ජනයා පදිංචි කිරීමක් ගැන මානව දයාවෙන් කතා කරති. තමන්ට විරුද්ධ දෙමළ ජනයා මරන, ළමයින් පැහැර ගෙන යන කොටින්ට මොන මානව දයාවක්ද? මොවුන් උතුරෙන් මුස්ලිම් හා සිංහල ජනයා අතුගා දැම්මේ මානව දයාවෙන්ද? සිංහලයන් හා මුස්ලිම් පදිංචි කරවීම ගැන කොටි කටේ පිට්ටු ද? මිනිසුන් ආපසු තමන් සිටි තැන්වල පදිංචි කළ යුතු බව සැබෑ ය. මිනිසුන් ජීවත් විය යුතු බව ද සැබෑය. එහෙත් ඒ සියල්ලට පළමුව රට හා ජාතිය ජීවත්විය යුතුය. රටේ හා ජාතියේ පැවැත්ම අන් සියල්ලටම වඩා වැදගත්ය. මිනිසකු වැඩිම වුවහොත් අවුරුදු සියයක් පමණ ජීවත් වනු ඇත. එහෙත් ජාතියක් යනු එසේ නොවේ. අපේ ජාතියට අවුරුදු දෙදහස් පන්සියයක පමණ ඉතිහාසයක් ඇත. පුද්ගලයන් පදිංචි කරවීමට පෙර ජාතියේ පැවැත්ම තහවුරු කළ යුතුය.

අපේ රටේ විවිධ කෙෂත්‍රවල ජාතික ප්‍රතිපත්ති නැතැයි කියැවෙයි. එයට ප්‍රධාන හේතුව අපට ඒ සියලු ජාතික ප්‍රතිපත්ති පිටුපස තිබිය යුතු පාර (මෙටා) ජාතික ප්‍රතිපත්තියක් නැතිකමය. පාර ජාතික ප්‍රතිපත්තිය විය යුත්තේ අන්

© Prof. Nalin De Silva

කිසිවක් නොව පුද්ගලයාට වඩා රට ජාතිය ප්‍රධානය යන්නය. පාර ජාතික ප්‍රතිපත්තියක් ඇති විට අනෙක් ජාතික ප්‍රතිපත්ති නිරායාසයෙන්ම සූත්‍රගත කර ගත හැකිය. බටහිරයන්ට මේ පාර ජාතික ප්‍රතිපත්තිය ඇත. එහෙත් ඔවුහු අද බංකොළොත් පශ්චාත් නූතනවාදී අදහස් මගින් ලෝකය පුරා අනෙක් රටවලට පාර ආඛ්‍යාන නැතැයි ප්‍රචාරය කරති. පශ්චාත් නූතනවාදය එක් අතෙකින් බටහිර චින්තනයේ අර්බුදය පිළිබිඹු කරන අතර අනෙක් අතින් අප වැනි රටවල පොරවල්වලට පොරෝ තනා දෙයි. බංකොලොත් පශ්චාත් නූතනවාදයෙහි පාර ආඛ්‍යාන නැති බවට ලියෝතාද පවසන කතාව අපි සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරමු. එසේ නැතැයි පැවසීම ම පාර ආඛ්‍යානයක් බව ලියෝතාට නොවැටහේද?

කොටි ඊනියා මානව හිතවාදයක නාමයෙන් ජනයා පදිංචි කරන මෙන් ඉල්ලා සිටියේ ඊනියා සටන් විරාමය තුළ හමුදාව පන්නා ගැනීමටය. අධි ආරක්ෂිත කලාපයෙන් හමුදා ඉවත් කිරීම ඊනියා මානව හිතවාදයක් සමග පටලවා ඔවුහු ප්‍රශ්නය අවුල් කිරීමට උත්සාහ ගත්හ. කොටින්ට පාර ප්‍රතිපත්තියක් ඇත. ඒ ඊළම පිහිටුවීමය. ඔවුන් සියලු ඉල්ලීම් කරන්නේ ඒ තුළය. බොරු මානව හිතවාදය ද ඒ සඳහා ය. එහෙත් මෙය විනිවිද දැකීමට හමුදාවට හැකිවිය. දේශපාලනඥයන්ට එහි දී කළ හැකි කිසිවක් නොවීය. ඉදිරියටත් මේ පැහැදිලි බව තිබිය යුතුය. පාරදෘශ්‍යභාවයක් ගැන කියන්නන්ට මෙවැනි කරුණු ජනතාවගෙන් හංගීමට කතා කළ නොහැකිය. කෙසේ හෝ හමුදාවේ එඩිතර බව හා දුර දක්නා නුවණ හේතුවෙන් පළමු වරට කොටි ඊනියා සාකච්ඡා තුළ පරාජයට පත්වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස කොටි සාමාන්‍යකරණය සඳහා වූ ඊනියා අනුකම්ටුව ප්‍රතික්ෂේප කර ඇත. මේ සාමාන්‍යකරණය යනු අන් කිසිවක් නොව හමුදාව යාපනයෙන් පැන්නීමත් කොටි එහි බලය ලබා ගැනීමත්ය. කොටි සාමාන්‍ය තත්ත්වය යැයි කියන්නේ උතුරු හා නැගෙනහිර පළාත් ඔවුන්ගේ පාලනය යටතේ තිබීමටය. එහෙත් මේ අනුකම්ටුව ඒ නමින් හෝ වෙනත් නමකින් හෝ නැවත පිහිටුවීමට නෝර්වේ තානාපති කාර්යාලය උත්සාහ කරනු ඇත. හමුදාව ඉවත් කර ගැනීමේ තර්ජනය මේ එජාපෙ ආණ්ඩුව යැයි කියන්න තිබෙනතාක් නැති නොවනු ඇත.

නෝර්වේ තානාපති දවල් මිගෙල් රෑ දනියෙල් චරිතය රඟපායි. ඔහු වරෙක ඊනියා පහසුකම් සපයන්නා වෙයි. තවත් වරෙක තානාපති වෙයි. මේ දෙක දෙකක් බවත් ඒ පටලවා නොගත යුතු බවත් බටහිරයකු ලෙස ඔහු දනියි. බටහිරයන් අපට කියන්නේ රාජ්‍යය ආගමෙන් වෙන් කර ගත යුතුය නිරීක්ෂකයා නිරීක්ෂයෙන් වෙන් විය යුතු ය ආදී කතාය. එසේ නම් තානාපති පහසුකම් සපයන්නාගෙන් වෙන් විය යුතුය. අධි සංවේදී ගුවන් විදුලි උපකරණ කොටින්ට ගෙනාවේ නෝර්වේ තානාපති හරහාය. ඔහු මෙන්ම අගමැතිවරයාද පවසන්නේ වෙස්ටබෝර්ග් ඒ කාරණයට මැදිහත් වූයේ පහසුකම් සපයන්නා ලෙස බවය. එහෙත් ඊනියා පහසුකම් සපයන්නාට තානාපති වරප්‍රසාද නැත. පහසුකම් සපයන්නා ලෙස තානාපති සම්බන්ධකම් නැති රටක් වුවද පත්කර ගත හැකිය. වෙස්ටබෝර්ග් ගුවන් විදුලි උපකරණ ගෙනාවේ පහසුකම් සපයන්නා ලෙස නම් තීරු බදු ගෙවීමෙන් රේගුවේ පරීක්ෂාවට ලක් කිරීමෙන් ඔහුට නිදහස් විය නොහැකිය. ඔහු මේ භාණ්ඩ ගෙන්වා ඇත්තේ තානාපති වරප්‍රසාද යොදා ගැනීමෙනි. තානාපති හා පහසුකම් සපයන්නා යනු එක තනතුරක් නොව තනතුරු දෙකක් බව මේ බටහිරයා නොදත්තේද? දේශපාලන විද්‍යාව උගන්වමින් රාජ්‍යය ආගමෙන් වෙන් විය යුතු යැයි කියන මහාචාර්යවරයා මේ පිළිබඳ කියන්නේ කුමක්ද? වෙන් කිරීම පිටුපස ඇති එකතු කිරීම වෙස්ටබෝර්ග් අපට පෙන්වා දී ඇත. අප පාලනය කරන්නේ බටහිර මතවාද හරහා බැවින් ඒ පරාජය කිරීම අපේ කාර්යය වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva